www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ගෝලීය තරුන විරැකියාව වාර්තාගත මට්ටම්වලට ලඟා වේ

## Global youth unemployment reaches record levels

**ජෝඩන් ශ්ලටන් විසිනි.**
**2010 අගෝස්තු 31**

ලෝක යෞවන රැකියා අපේක්ෂාවන් මත ගෝලීය ආර්ථික අර්බුදය ඇති කරන බරපතල බලපෑම ගෙනහැර දක්වන වාර්තාවක් ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ජාකස) විසින් නිකුත් කර ඇත. "තරුනයින් සඳහා වන ගෝලීය රැකියා ප්‍රවනතා" නම් මෙම වාර්තාව විරැකියාවෙන් පෙලෙන වයස අවුරුදු 15-24 අතර යෞවනයන්ගේ සංඛ්‍යාව ඉහල නැගීම පිලිබඳ සවිස්තරාත්මක සංඛ්‍යා දත්ත ඉදිරිපත් කරයි.

මේ අතරින් වඩාත්ම කැපී පෙනෙන්නේ 2008 වර්ෂයේ සහ ඉන් ඉක්බිත්තෙහි පිපිරී ආ මූල්‍ය අර්බුදයෙන් තරුන විරැකියාවේ සීඝ්‍ර ඉහල නැගීමයි. වාර්තාවේ හැඳින්වීමට අනුව 2009 වසරේ අගවන විට, ගෝලීය තරුන විරැකියාව මිලියන 81 ලෙස පැවතුනි. මෙය 2007 වසරේ අග පටන් මිලියන 7.8 ක එනම් ආසන්න වශයෙන් සියයට 10 ක ඉහල නැගීමක් විය.

ප්‍රතිශත වශයෙන් ගත් කල, ගෝලීය තරුන විරැකියාව මෙම කාල සීමාව තුල සියයට 11.9 ක සිට සියයට 13 ක් දක්වා ඉහල නැගි අතර, එම වැඩි වීම "පෙර කවරදාකටත් වඩා තියුනු" වැඩි වීමක් බව වාර්තාව පෙන්වා දෙයි.

2009 වර්ෂයේ දී පමනක්, ලොව පුරා රැකියා විරහිත තරුනයන්ගේ සංඛ්‍යාව මිලියන 6.6 ක විශ්මයජනක අගයක් දක්වා ඉහල නැගුනි. වාර්තාව සඳහන් කරන ආකාරයට, "යථා පරිද්දෙන් සලකන කල, වර්තමාන අර්බුදයට පූර්වයෙන් වූ වර්ෂ දහයක කාල සීමාව තුල (1996-97 සිට 2006-07), සාමාන්‍යයෙන් වසරකට රැකියා විරහිත තරුනයන්ගේ ගනන වැඩි වී ඇත්තේ 192,000 බැගිනි."

මෙම ඉහල යාමේ වේගය අඩු වෙනු ඇති නමුත් 2010 අගවන විට ගෝලීය තරුන විරැකියාව සියයට 13.1 ක අගයක පවතිනු ඇතැයි වාර්තාව ගනන් බලා ඇත. වඩාත් අර්ථභාරී ලෙස එය අවධාරනය කලේ, 2011 දී විරැකියා අනුපාතය සුලු වශයෙන් පහත වැටුනද, අර්බුදයට කලින් වකවානුවේ පැවතියා වූ වඩා පහල විරැකියා මට්ටම් කරා නැවත පැමිනීමක් නොවනු ඇති බවයි.

තරුනයින් ශ්‍රම වෙලඳපලෙන් ඈත් වීමේ හා වර්තමාන තරුන පරපුර "අපේක්ෂා භංග පරම්පරාවක්" වීමේ අන්තරාය පිලිබඳව වාර්තාව අනතුරු හඟවයි. ආර්ථික පසු බෑමේ කාල සීමාව තුල ශ්‍රම වෙලඳපලට ඇතුල් වීම තරුන පරම්පරාව මත කල් පවතින කැලැල් ඉතුරු කර තැබිය හැකි බව අධ්‍යනයන් කිහිපයකින් ම පෙන්වා දී ඇති බවත් ශ්‍රම වෙලඳපලෙන් සම්පූර්නයෙන් ම හුදෙකලාවූ තරුනයන්ගෙන් සමන්විත "අපේක්ෂා භංග පරම්පරාවක්" අර්බුදයේ උරුමය විය හැකි වීම පිලිබඳ සංකා මෑත කාලයේ දී මතු වී ඇති බවත් එය සඳහන් කරයි.

මෙවන් තත්වයක දී පාලක ප්‍රභූවේ අවධානය යොමු විය යුතු කාරනය සම්බන්ධයෙන් වාර්තාව ඉඟි කරයි. "ඵලදායී අනාගතයක් ගැන බලාපොරොත්තු අත්හැර දමා සිටින තරුනයින් සෙවීම සහ ඔවුන්ව දිරි ගැන්වීම වියදම් සහිත කාර්යයකි. එසේ වුවත්, කිසිවක් නොකර සිටීමේ විකල්පය සමාජීය, ආර්ථික මෙන්ම දැරීමට සිදුවිය හැකි දේශපාලන වියදම් ද එකතු කර බැලූ විට වඩාත් වියදම්කාරී වෙයි."

ජාකස අධ්‍යක්ෂ ජනරාල් ජුවාන් සොමැවියා මේහා සමාන තේමාවක් යටතේ කථා කරමින්, "තරුනයින් ආර්ථික සංවර්ධනයට හවුල් කරගත යුතුය. ඔවුන්ගේ ශක්‍යතාව අත් හැර දැමීම ආර්ථික නාස්තියක් වනවා මෙන්ම සමාජ ස්ථාවරත්වය දුර්වල කරන්නක් විය හැකි" යයි ප්‍රකාශ කලේ ය.

ජාකස වාර්තාව සැලකිල්ලට ගෙන ඇත්තේ, ආන්ඩු ජාත්‍යන්තර පරිමානව උත්තේජක පැකේජ ක්‍රියාවට දමනු ලැබූ ආර්ථික පල්ලම් බැසීමේ ආරම්භක කාලපරිච්ඡේදය පමනක් බව මෙහිලා සඳහන් කල යුතුය. බැංකු ගලවා ගැනීමට දුන් ඇප මුදල්, කම්කරු පන්තියෙන් ආපසු ලබා ගැනීම සඳහා වූ කප්පාදු පිලිවෙත් කෙරෙහි ධනේශ්වරයේ අවධානය යොමුවී ඇති තත්වය තුල සෑම රටකම විරැකියාව ඉහල නගිනු ඇතැයි ගනන් බලා තිබේ.

වාර්තාව පැහැදිලි කරන ආකාරයට, කම්කරු පන්තියේ වඩාත්ම පීඩනයට පත්ව සිටින කොටස වන

තරුනයන් හට විරැකියාව ඉහල යාමේ බරපතලම ප්‍රතිවිපාක වලට මුහුන පෑමට සිදුවනු ඇත. තරුන විරැකියා අනුපාතය සියයට 12.1 ත් වැඩිහිටියන් අතර විරැකියාව සියයට 4.3 කත් තිබූ 2008 වර්ෂයේ දී තරුනයින් රැකියා විරහිත වීමේ හැකියාව වැඩිහිටියන්ට වඩා 2.8 ක වාරයක් ඉහලින් පැවතුනි. අර්බුදයට කලින් ආර්ථික වර්ධනයක් පැවති අවසාන කාල පරිච්ඡේදයේ දී ශ්‍රම වෙලඳපල තුල ක්‍රියාකාරී තරුනයන්ගේ ප්‍රතිශතය 1998 සියයට 54.7 සිට 2008 වන විට සියයට 50.8 දක්වා පහත වැටුනි.

මෙලෙස ගෝලීය ප්‍රවනතා ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, අධ්‍යයනය ලෝකයේ විවිධ කලාප පුරා තරුනයින් බලපෑමට ලක්ව ඇති ආකාරය විස්තර කරයි. මෙහිදී වඩාත් ම නරක තත්වයක් ඇත්තේ දුප්පත් ම ප්‍රදේශයන්හි ය.

දකුනු ආසියාවේ තරුනයින් මිලියනයක් වර්තමානය සහ 2015 අතර, සෑම වර්ෂයක දීම, රැකියා සෙවීමේ අපේක්ෂාවෙන් පසුවන අතර උප සහරා කලාපයේ මෙම අගය මිලියන 2.2 කි. 2008 වර්ෂයේ දී, මැද පෙරදිග සහ උතුරු අප්‍රිකාවේ තරුන ජනගහනයෙන් සියයට 20 ක් රැකියා සොයා ගැනීමට අසමත් විය.

මෙම කලාපවල රැකියාවක නියුක්ත වූවන්ට පවා ඔවුන්ගේ ජීවන තත්වයන් හී කඩා වැටීමක් දැකගත හැකි විය. සියලු තරුන කම්කරුවන් අතරින් දල වශයෙන් සියයට 28 ක් දිනකට ඇමරිකානු ඩොලර් 1.25 කට අඩු ආදායමක් සහිතව තම ජීවිකාව පවත්වා ගෙන යන කම්කරු දුගීන් ගනයට අයත් වන බව වාර්තාව ගනන් බලා ඇත.

මෙම වාර්තාව නිකුත් කිරීමට සමගාමීව ප්‍රකාශයට පත් කරන ලද මාධ්‍ය වාර්තාවක, අධ්‍යක්ෂක-ජනරාල් සොමැවියා මෙසේ පැවසීය. "සංවර්ධනය වෙමින් පවතින රටවල දුප්පතුන්ගේ දෛනික ජීවිතය පුරා අර්බුදය පැතිරී පවතී. ආර්ථික හා මූල්‍ය අර්බුදයේ බලපෑම් තරුනයින් අතර පෙරදා පැවතුනු දුෂ්කර වැඩ කොන්දේසි තවත් නරක අතට හැරවීමට තර්ජනය කර සිටී. මෙහි ප්‍රතිපලය වශයෙන්, කම්කරු දුගී බවේ ගිලී සිටින තරුනයින් සංඛ්‍යාව වැඩී යමින් කම්කරු දුගී භාවයේ මෙම චක්‍රය අඩු තරමින් තවත් එක් පරම්පරාවකට දිග්ගැස්සෙනු ඇත."

සංවර්ධිත ආර්ථිකයන් ද බලපෑමට ලක් වී ඇත. වාර්තාව පෙන්වන ආකාරයට සංවර්ධිත ආර්ථිකයන්හි හා යුරෝපා සංගමයේ කලාපයන් හි තරුන විරැකියාව ඉහල නැගීම සියයට 4.5 ක් වන අතර මධ්‍යම හා නැගෙනහිර යුරෝපයේ (යුරෝපා සංගමයට අයත් නො වන) හා පොදු රාජ්‍ය මන්ඩලීය ස්වාධීන රාජ්‍යයන්ගේ ඉහල නැගීමේ අනුපාතය සියයට 3.5 ක් විය. මෙම අගයන් වාර්ෂික ඉහල නැගීම්වල මෙතෙක් වාර්තා වූ ඉහලම අගයන් වෙයි.

සංවර්ධිත ආර්ථිකයන්හි හා යුරෝපීය සංගමයේ සියයට 17.7 ක් වූ 2009 යේ සමස්ත තරුන විරැකියා අනුපාතය, වාර්තා කිරීම් ආරම්භ කල 1991 සිට වූ ඉහලම මට්ටම වේ.

ගෝලීය තරුන ජනගහනය අතරින් සියයට 10 ක් පමනක් "සංවර්ධිත ආර්ථිකයන්" හි ජීවත් වන නමුත් විරැකියාව ඉහල නැගීමේ සියයට 45 ක් වාර්තා වී ඇත්තේ මෙම රාජ්‍ය වලිනි. උදාහරනයක් ලෙස එක්සත් ජනපදයේ තරුන විරැකියාව 2009 දී සියයට 8 කින් වැඩි වී සියයට 18 ට ලගා විය. බ්‍රිතාන්‍යයේ තරුන ජනතාව අතර දීර්ග කාලීන විරැකියාව සියයට 42 කින් වැඩි වී ඇති බව ඩේලි ටෙලිග්‍රාෆ් මෑතක දී වාර්තා කලේ ය.

© www.wsws.org